සවියෙන් පෙරට අපි එකට

e- ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

| විෂයය | ශ්‍රේණිය | වාරය | පාඩම |
|---|---|---|---|
| ඉතිහාසය | 6 | 3 | 05. අපේ අතීත රජවරු<br>I කොටස - පණ්ඩුකාභය රජතුමා |








සැකසුම - බෝධිනි අපර්ණා ගුණවර්ධන

පාසල - බප/හො/ සාගරපලන්සූරිය මහා විද්‍යාලය.

# පණ්ඩුකාභය රජතුමා



- පණ්ඩුකාභය රජතුමාගේ පියා දීඝගාමිණී කුමරු ය.
- මව චිත්‍රා කුමරිය යි.
- පණ්ඩුකාභය කුමරු පණ්ඩුල නම් බ්‍රාහ්මණයකුගෙන් අධ්‍යාපනය හැදෑරී ය.
- පණ්ඩුකාභය කුමරු ස්වර්ණපාලි නම් කුමාරිකාවක් හා සරණ පාවා ගත්තේ ය.

- අනුරාධග්‍රාම නමින් හැඳින්වූ අනුරාධපුරය පණ්ඩුකාභය රජතුමාගේ රාජධානිය විය.

- නගරයක් අසල විශාල වැවක් පළමු වරට ඉදිකළේ මේ රජතුමා යි.

- අනුරාධපුරයේ තැනූ මෙම වැව ඒ කාලයේ අභය වැව නමින් හැඳින්වූ අතර අද හඳුන්වන්නේ බසවක්කුලම නමින් ය

# බසවක්කුලම වැව






අභයවැව (බසවක්කුලම)
அபயவெவ (பஸவக் குளம்)
Abhayawewa( Basawakkulama)
According to the chronicle Mahavamsa King Pandukabhaya had constructed three reservoirs. They are Abhayavapi, Gaminivapi and Jayvapi. Abhayavapi is identified as the first reservoir to be built by this king in Anuradhapura. Abhayaweva is a traditional village tank, presently covering an area of 130 hectares. It is now known as Basawkkulama Weva.
Director General of Archaeology

- පණ්ඩුකාභය රජතුමා විසින් අනුරාධපුරය සිත්ගන්නා නගරයක් ලෙස ගොඩනගන ලදී.
  - ✓ නගරය වටා සීමා ලකුණු කරන ලදී.
  - ✓ නගරය ආරක්ෂා කිරීම සඳහා දිය අගළක් ඉදිකරන ලදී.
  - ✓ නගරයට ඇතුළු වීමට තැන් අවශ්‍ය නිසා ප්‍රධාන දිශා හතරේ දොරටු හතරක් නිර්මාණය කොට එම දොරටු හරහා නගරයේ අනෙක් කොටස් සම්බන්ධ වන පරිදි මාර්ග පද්ධතියක් පිහිටුවී ය.

- ✓ නගරයක ජීවත් වීමේ දී එහි වාසය කරන මිනිසුන්ගේ කැළිකසළ ආදි දේ ඉවත් කිරීම සඳහා නගරය පිරිසිදු කිරීමට සේවකයින් පන්සියයක් ද,
- ✓ වැසිකිළි පිරිසිදු කිරීමට සේවකයින් විසි දෙදෙනෙකු ද,
- ✓ මළසිරුරු ගෙන යාමට සේවකයින් එකසිය පනහක් ද,
- ✓ සොහොන් පිරිසිදු කිරීමට සහ මුර කිරීමට සේවකයින් එකසිය පනහක් ද එසේ පත් කළ පිරිසට අයත් විය
- ✓ නගරයේ ජීවත්වන්නන්ගේ අවශ්‍යතාව සඳහා රෝහලක් ඉදි කිරීමට එතුමා කටයුතු යෙදී ය.

- නගරයේ විසූ විවිධ ජනකොටස් අතර ආගමික සහජීවනය ඇති කිරීමේ අරමුණින්,
  - ✓ ඒ ඒ ආගම් වෙනුවෙන් දේවාල ගොඩ නැංවී යි
  - ✓ ඒ කාලයේ නගරයේ කම්මල් වැඩ කළ අය ඇදහූ කම්මාරදේව නමින් හඳුන්වන ලද දෙවියෙක් සිටියේ ය.
    රජතුමා එම දෙවියන්ට ද එකල විසූ වැදිජනයාගේ දෙවියන්ට ද නගරයේ බටහිර දොරටුව අසල දේවාල තනා දුන්නේ ය.
  - ✓ ඒ අයුරින් වෙනත් ආගමික පූජකයින්ට ද ආගමික කටයුතු සඳහා අවශ්‍ය ගොඩනැගිලි ඉදි කොට පූජා කළේ ය

- පණ්ඩුකාභය රජතුමා මෙසේ මහත් වෙහෙසක් දරමින් තම රටවැසියන්ගේ යහපත වෙනුවෙන් උදාර සේවාවක් කරමින් අවුරුදු හැත්තෑවක් මෙරට රජකම් කළේ ය.




අංක 5.1 පණ්ඩුකාභය රජතුමා විසින් සැලසුම් කරන ලද අනුරාධපුර නගරය පිළිබඳව මහාවංශයේ තිබෙන විස්තරයට අනුව අඳින ලද සිතුවමක්.

සවියෙන් පෙරට අපි එකට

*e*- ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

| විෂයය | ශ්‍රේණිය | වාරය | පාඩම |
| --- | --- | --- | --- |
| ඉතිහාසය | 6 | 3 | 05. අපේ අතීත රජවරු<br>I කොටස - පණ්ඩුකාභය රජතුමා<br>-- ඇගයීම-- |

**සැකසුම - බෝධිනි අපර්ණා ගුණවර්ධන, බප/හො/ සාගරපලන්සූරිය මහා විද්‍යාලය**

**සියලුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

01. පණ්ඩුකාභය රජතුමාගේ පියා සහ මව නම් කරන්න.

02. පණ්ඩුකාභය රජතුමා සරණ පාවා ගත් කුමරිය කවුරුන් ද?

03. පණ්ඩුකාභය රජතුමා කුඩා කල අධ්‍යාපනය හැදෑරුවේ කාගෙන් ද?

04. පණ්ඩුකාභය රජතුමා සෑදු වැව නම් කරන්න.

05. අනුරාධගාම නමින් හැඳින්වූයේ කුමන රාජධානිය ද?

06. මෙතුමා විසින් නගර සැලසුම් සඳහා ගත් ක්‍රම සඳහන් කරන්න.

සවියෙන් පෙරට අපි එකට
e- ඉගෙනුම් පාසල
හොරණ අධ්‍යාපන කලාපය

| විෂයය | ශ්‍රේණිය | වාරය | පාඩම |
|---|---|---|---|
| ඉතිහාසය | 6 | 3 | 05. අපේ අතීත රජවරු<br>I කොටස - පණ්ඩුකාභය රජතුමා<br>-- පිළිතුරු-- |

**සැකසුම - බෝධිනි අපර්ණා ගුණවර්ධන, බප/හො/ සාගරපලන්සූරිය මහා විද්‍යාලය**

1) පියා - දීඝගාමිණී කුමරු        මව- චිත්‍රා කුමරිය

2) ස්වර්ණපාලි කුමාරිකාව

3) පණ්ඩුල බ්‍රාහ්මණයාගෙන්

4) අභය වැව (බසවක් කුලම)

5) අනුරාධපුරය

6)

- නගරය වටා සිමා ලකුණු කරන ලදි.
- නගරය ආරක්ෂා කිරීම සඳහා දිය අගළක් ඉදිකරන ලදි.
- නගරයට ඇතුළු වීමට තැන් අවශ්‍ය නිසා ප්‍රධාන දිශා හතරේ දොරටු හතරක් නිර්මාණය කොට එම දොරටු හරහා නගරයේ අනෙක් කොටස් සම්බන්ධ වන පරිදි මාර්ග පද්ධතියක් පිහිටුවි ය.
- නගරයේ වාසය කරන මිනිසුන්ගේ කැළි කසළ ඉවත් කිරීම සඳහා නගරය පිරිසිදු කිරීමට සේවකයින් පන්සියයක් ද, වැසිකිළි පිරිසිදු කිරීමට සේවකයින් විසි දෙදෙනෙකු ද, මළසිරුර ගෙන යාමට සේවකයින් එකසිය පනහක් ද, සොහොන් පිරිසිදු කිරීමට සහ මුර කිරීමට සේවකයින් එකසිය පනහක් ද පත් කිරීම
- රෝහලක් සහ විවිධ ආගම් වෙනුවෙන් දේවාල ගොඩ නැංවීම.